# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 6
# දරන තැපැල් කාර්යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 6 දරන තැපැල්
කාර්යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 පෙබරවාරි මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 45/72.

**තැපැල් කාර්යාල ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 6 දරන තැපැල් කාර්යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. තැපැල් කාර්යාල ආඥාපනතෙහි 8 වන වගන්තිය ඉවත් කිරීමෙන් හා පහත සඳහන් වගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන් එම ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 190 වන අධිකාරයේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

" රීති සෑදීමේ බලය.

8. (1) අමාත්‍යවරයා විසින් රීති මගින්—

(අ) මෙරට තැපැල් භාණ්ඩ වෙනුවෙන් හෝ මෙරට තැපැල් භාණ්ඩ යම් වර්ගයක් වෙනුවෙන් තැපැල් ගාස්තු කලින් ගෙවීමට නියම කිරීම හා කලින් ගෙවිය යුතු ආකාරය නියම කිරීම ද ;

(ආ) මෙරට තැපැල් භාණ්ඩ වෙනුවෙන් තැපැල් ගාස්තු කලින් ගෙවා නොමැති විට හෝ ප්‍රමාණවත් තැපැල් ගාස්තු ගෙවා නොමැති විට ඒ තැපැල් භාණ්ඩ වෙනුවෙන් අය කළ යුතු තැපැල් ගාස්තු නියම කිරීම ද ;

(ඇ) ගාස්තු අය නොකොට හෝ රීතිවල නියම කරනු ලැබිය හැකි අමතර ගාස්තුවකට යටත්ව තැපැල් භාණ්ඩ හරවා යැවීම හා එසේ හරවා යවනු ලබන භාණ්ඩ තැපෑලෙන් යැවීම සඳහා විධිවිධාන සැලැස්වීම ද ;

(ඈ) යෝග්‍ය යැයි කලින් කල සලකනු ලබන සීමාකිරීම්වලට යටත්ව රාජ්‍ය සේවයේ නිලධරයන් විසින් හා ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන් විසින් තැපැල් භාණ්ඩවලට නිල මුද්‍රාව යොදනු ලැබීමට විධිවිධාන සැලැස්වීම ; සහ

(ඉ) තැපැල් ගාස්තු වශයෙන් නියමිත ගාස්තු ප්‍රමාණයන් අය කළ යුත්තේ යම් බර ප්‍රමාණයනට, නියමයනට හා කොන්දේසිවලට යටත්ව ද ඒ බර ප්‍රමාණයන්, නියමයන් හා කොන්දේසි නියම කිරීම ද

කළ හැකි ය.

කේ 18747—9471 (73/3)

(2) ඒ සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට බල පැවැත්විය යුතු ය. එසේ පළ කරනු ලැබූ දිනයෙන් පසු හැකි ඉක්මණින් ඒ සෑම රීතියක් ම ජාතික රාජ්‍ය සභාව හමුවේ තබනු ලැබිය යුතුය. ඒ රීති එසේ ජාතික රාජ්‍ය සභාව හමුවේ තබනු ලැබූ දිනයේ සිට මාස තුනක කාලපරිච්ඡේද යක් ඇතුළත ඉන් කිසියම් රීතියක් ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත නොකරනු ලැබුවහොත් ඒ රීතිය බල පැවැත්වීම එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව ඒ අනනුමතියේ දින සිට නතර විය යුතුය. එකී මාස තුනේ කාල පරිච්ඡේදය ගණන් ගැනීමේ දී ජාතික රාජ්‍ය සභාවේ රැස්වීම් වාර නොපැවැත්වෙන යම් කාලපරිච්ඡේද යක් ගණන් නොගත යුතුය. ".